# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.07 පැය 2330 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/673/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීමක් සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම - තිනියාවල පොලිස් ස්ථානය.**

බීමතින් සිටින පොලිස් නිලධාරීන් තමන්ට පහර දෙන බවටත්, තමා බීමතින් සිටින බවට ප්‍රකාශ කරමින් අත්අඩංගුවට ගැනීමට උත්සාහ දරන බවටත්, පවසමින් පුද්ගලයෙකු විසින් වීඩියෝ ගත කරන ලද සිදුවීමක් මෙම දිනවල සමාජ මාධ්‍ය හරහා සංසරණය වෙමින් පවතී.

මෙම සිදුවීම 2025.04.06 වන දින රාත්‍රී කාලයේ තිනියාවල පොලිස් වසමේ සිදුවූ සිදුවීමක් වන අතර එහිදී පුද්ගලයෙකු බීමතින් යතුරුපැදියක් ධාවනය කරන බව නිරීක්ෂණය වීමෙන් පසු රථවාහන රාජකාරි යෙදී සිටි නිලධාරීන් විසින් එම යතුරුපැදිය නවතා පරීක්ෂා කිරීමේදී මෙම පුද්ගලයා කෑගසමින් පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පා රාජකාරියට බාධා කර ඇත. අනතුරුව ආසන්නයේ සිටි අනෙක් පුද්ගලයින්ද සහභාගි කර ගනිමින් පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පා ඔහු එම ස්ථානයෙන් යතුරුපැදිය ද රැගෙන පලා ගොස් ඇත.

2025.04.07 වන අද දින මෙම පුද්ගලයා පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම සහ පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරයපෑම යන චෝදනා යටතේ අත්අඩංගුවට ගෙන ඇති අතර මොහු මීට පෙරද මත්ද්‍රව්‍ය චෝදනා යටතේ අධිකරණයෙන් වැරදිකරු වී දඬ නියම කරන ලද පුද්ගලයෙකු වේ.

මෙවැනි ආකාරයට පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කරන ලද සියලුම පුද්ගලයින් අත්අඩංගුවට ගෙන නීතිය ඉදිරියට ගෙන ඒමට ශ්‍රී ලංකා පොලිසිය කටයුතු කරන අතර මෙම සිද්ධියේ වැඩිදුර විමශර්න කටයුතු කළුතර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය මඟින් සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**